මගේ අංකය 3/ පී එම් ඩී /එස් ඩී / එස් එස් / 43,
ඉංග්‍රීසි පිළිබඳ ජාතික සමායෝජන ඒකකය,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1994 ජනවාරි මස  වන දින.

චක්‍රලේඛ අංකය: 94 / 05

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා
සියලුම ජාතික පාසල් විදුහල්පතීන් වෙත.

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) පන්තිවල ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම

1. පාසල්වල අ.පො.ස (සා. පෙ.) විභාගය සඳහා සිසුන්ට ඉංග්‍රීසි සාහිත්‍යයට පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට මෙම අමාත්‍යාංශය තීරණය කොට ඇත.

2. පාසල්වල මෙම විෂයය ඉගැන්වීමට අවශය පහසුකම් සපයාලන අතරම, එය අමතර විෂයයක් වශයෙන් පාසලේදී හදරා, නව වන විෂයයක් වශයෙන් එම විෂයෙන් විභාගයට ඉදිරිපත් වීමට සිසුන්ට අනුබල දිය යුතුය.

3. විෂයය ධාරා හැඳින්වීමේ දී පාසල් කාල සටහනට වෙන් කොට තිබූ සම්බන්ධීකරණ කාලච්ඡේද මේ සඳහා යොදා ගත හැක.

4. ඉංග්‍රීසි ගැඹුරින් හැදෑරීමට මේ ආරම්භක පියවර හේතු කාරක වනු ඇත.

5. 1994 පළමුවන පාසල් වාරයේම ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම ආරම්භ කළ යුතු හෙයින්, දනට පාසලේ සේවයේ යෙදී සිටින ගුරුභවතුන්ට අමතරව අවශ්‍යවන විෂයය ප්‍රවීණ ගුරු සංඛ්‍යා, අධ්‍යාපන අමාත්‍යංශයට යොමු කිරීමට කටයුතු සැලසිය යුතුය.

එන්. වී. කේ. කේ. වේරගොඩ
ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.